පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 06 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ඉතිහාසය

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2 යි

**1 - කොටසේ සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

**11 කොටසින් පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න**

- **අංක 1 - 5 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදා ගන්නා සාහිත්‍යමය මූලාශ්‍රයකි

i. පැරණි ගොඩනැගිලි
ii. සමරු පලක
iii. මහා වංශය
iv. සෙල්ලිපි

2) මිනිසෙකු  වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා හැඳින්වෙන්නේ

i. හෝමෝසාපියන් යන නමින්
ii. හෝමෝ ඉරෙක්ටස් යන නමින්
iii. හෝමෝ හැබිලස් යන නමින්
iv. ඔස්ට්‍රලෝපිතිකස් යන නමින්

3) ශරීර ලක්ෂණ අනුව අප්‍රිකාවේ ජීවත්වන මානව වර්ගය හැඳින්වෙන්නේ

i. කොකසොයිඩ්
ii. ඔස්ට්‍රලොයිඩ්
iii. නිග්‍රොයිඩ්
iv. මොංගෝලොයිඩ්

4) පලමු වරට නගරයක් අසල වැවක් ඉදිකළ රජු ලෙස සැළකෙනුයේ

i. දුටුගැමුණු රජු.
ii. දේවානම්පියතිස්ස රජු.
iii. පණ්ඩුකාභය රජු
iv. වසභ රජු.

5) මින්නේරි දෙවියන් ලෙස පිදුම් ලැබූ රජතුමා වන්නේ

i. ධාතුසේන රජු
ii. වළගම්බා රජු
iii. දේවානම්පියතිස්ස  රජු
iv. මහසෙන් රජු

- අංක 6- 10 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ ඇති පිළිතුරු අතරින් සුදුසු පිළිතුරු යොදාගෙන හිස්තැන් පුරවන්න

6) ඉන්දියාවේ බටහිර ප්‍රදේශය පාලනය කළ ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු විසින් ……………………...ක්‍රමය ආරම්භ කරන ලදී

7) …………………. ……………………වාසය කළ මිනිසා චිත්‍ර ඇඳීම සිදුකොට ඇත.

8) මමීකරණය ලොවට හඳුන්වාදෙන ලද්දේ ……………………………… වැසියන් විසිනි.

9) ඉසිගිරි නැමති ඇමතිවරයෙකු විසින් යාපන ප්‍රදේශය පාලනය කළ බව ……………………………… හි සඳහන් වේ.

10) ………………………….. වැසියන් විසින් පිළිස්සූ මැටි ගඩොල් භාවිතා කළ බවට සාක්ෂි හමුව තිබේ

(ඉන්දූනිමින / පුරා ශිලා යුගය /නව ශිලා යුගය /ශක වර්ෂ / වල්ලිපුරම් රන් සන්නස / පනා කඩුව තඹ සන්නස / ඊජිප්තු / මෙසපොතේමියානු )

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් x වැරදි ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න

11) නයිල් ගංගාව අප්‍රිකාවේ පිහිටා ඇත. (…. )

12) පිත මහ රජු යනුවෙන් හැඳින්වූයේ වසභ රජුයි (…. )

13) මෙසපොතේමියාව වර්තමානය වන විට අයත් වන්නේ ඉරානයටයි (…. ).

14) ලොව පැරණිතම අක්ෂර පද්ධතිය ලොවට හඳුන්වා දුන්නේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි. (…. ).

15) පාද කීපයක් තිබෙන හැකරැල්ලන් වැනි සතුන් .බිහිවූයේ සිලූරියන් යුගයේදීය (…. ).

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

16) යෝධ ඇලෙන් ලබා ගන්නා ජලයෙන් පෝෂණය වන වැව වන්නේ ………………………..

( තිසාවැව / කණදරා වැව / නුවර වැව ) යි.

17) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ …………………………………දීය

( මහනුවර දළදා මාළිගාවේදී ය. / අභයගිරි විහාරයේදීය/ මාතලේ අලූ විහාරයේදීය )

18) විජය කුමරු සමග ………………………...පිරිස මෙරටට පැමිණි බව ඉතිහාසයේ සඳහන් වේ.

( සත් සීයක් . / පන්සීයක් / හාරසීයක්)

19) ධාන්‍ය වර්ගයක් ලෙස වී මුලින් ම වගා කරන ලද්දේ ………….…………….....…ජාතිකයන්ය.

( ඉන්දියානු / මෙක්සිකානු / චීන )

20) බුදුන් වහන්සේ ගේ පරිනිර්වාණය සිදුවූයේ ……………..…………දීය .


( ක්‍රි. ව. 274 / ක්‍රි. පූ. 544 / ක්‍රි. පූ. 278 ) ( ලකුණු $2 \times 20 = 40$ යි

11- කොටස

පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වන අතර ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා ඇති ප්‍රශ්න අතරින් හතරකට පමණක් පිළිතුරු සපයන්න

1) ( අ ) පහත සදහන් ස්ථාන සදහා ගැළපෙන අක්ෂර ශ්‍රී ලංකා ආකෘති සිතියමේ දක්වා ඇති අක්ෂර වලින් තෝරා ලියන්න

i. මල්වතු ඔය
ii. අනුරාධ පුරය
iii. හුරුළුවැව
iv. දඹකොළපටුන
v. ත්‍රිකුණාමලය
vi. කලාවැව




(ලකුණු 1 × 6 =6 යි )


( ආ) පහත සදහන් පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

a



i. මෙම පින්තූරයෙන් දැක්වෙන අවස්ථාව කුමක්ද?

ii. මෙකල ශ්‍රී ලංකාවේ රජ කරවූ රජු කවුරුන්ද?



b

i. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන්ද?

ii. මෙම මූර්තිය අයත් වන ශිෂ්ටාචාරය කුමක්ද ?

c



i. මෙම මූර්තියෙන් නිරූපණය වන්නේ කවරෙක්ද ?

ii. මෙය කුමන ශිෂ්ටාචාරයකට අයත් වූවක්ද?

( ලකුණු 2× 3 = 6 යි )

2)

i. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඉගෙනීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර කොටස් දෙක නම් කරන්න. ( ලකුණු2 යි )

ii. ඉතිහාසයේ විවිධ සිදුවීම් අයත් කාල මැනීමට භාවිතා කරන ක්‍රම හතරක් ලියන්න ( ලකුණු 4 යි )

iii.a ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න ( ලකුණු 3 යි )

b ඔබ සදහන් කළ එක් ප්‍රයෝජනයක් පිළිබද කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 3 යි )

3)

i. පහත a b ප්‍රකාශ වල හිස් තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.


a පෘථිවියේ මුලින්ම බිහි වූ ජීවියා හඳුන්වන්නේ ……………….. නමිනි.

b පෘථිවියේ ශාක වර්ග පැතිරීම ආරම්භ වූ යුගය ……………නමින් හැඳින්වේ.

(සිලූරියන් යුගය / හැකරැල්ලන් /ප්‍රොකායෝට් බැක්ටීරියාව / පැලියෝසොයික යුගය ) (ලකුණු 2 යි )

ii. a ආදී මානවයින් සිය අවශ්‍යතා සපුරා ගැනීමේ දී භාවිතා කළ උපකරණ සකස් කිරීමට යොදා ගත් ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

b මෙම නිර්මාණය අයත් යුගය හා මෙය නිර්මාණය කොට ඇත්තේ කුමන ද්‍රව්‍යයක් උපයෝගී කර ගෙනද යන්න ලියා දක්වන්න.



( ලකුණු 4 යි )

iii. වරහන් තුළ ඇති පිළිතුරු යොදා ගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න

| මානව වර්ගය | විශේෂ හැකියාවන් |
|---|---|
| ඔස්ට්‍රලෝපිතිකස් | …………………. |
| …………………. | ගලකින් තවත් ගලකට ගසා මුවහත් මූණතක් සාදා ගැනීම |
| හෝමෝ ඉරෙක්ටස් | …………………. |
| …………………. | සතුන්ගේ ඇටකටු වලින් නිවාස සෑදීම |
| හෝමෝ සාපියන් | …………………. |

(හෝමෝ හැබිලස් / පාද දෙකෙන් ඇවිද යෑම /එකිනෙකා අතර අදහස් හුවමාරුවට හැකි භාෂාවක් භාවිතය / හෝමෝ නියැන්ඩතාලීසස් /ගින්දර භාවිතයට පෙළඹීම ) ( ලකුණු 6 යි )

4)

i. මෙවලම් වල ස්වරූපය අනුව මිනිසාගේ සංස්කෘතික දියුණුව දැක්වෙන ප්‍රධාන අවධීන් දෙකක් නම් කරන්න.

( ලකුණු 2 යි )

ii. මධ්‍ය ශිලා යුගයේ මිනිසාගේ විශේෂ ගති ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. ( ලකුණු 4 යි )

iii. නව ශිලා යුගයේ මිනිසාගේ ජීවන රටාව ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අංශය | කටයුතු කළ ආකාරය |
|---|---|
| ආහාර සපයා ගැනීම | |
| මෙවලම් භාවිතය | |
| ආගමික කටයුතු | |

( ලකුණු 6 යි )

5)

i. ලෝකයේ බිහි වූ පැරණිතම ශිෂ්ටාචාර දෙකක් නම් කරන්න ( ලකුණු 2 යි )

ii. පහත සඳහන් සොයා ගැනීම් ලෝකයට දායාද කළේ කුමන ශිෂ්ටාචාරයන් දැයි ලියා දක්වන්න.

1 වෘත්තයකට අංශක 360 ක් ඇති බව

2 වෙඩි බෙහෙත් සොයා ගැනීම

3 රබර් බෝලය නිපදවීම

4 කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය නිපදවීම ( ලකුණු 4 යි )

iii. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ නගර නිර්මාණය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. ( ලකුණු 6 යි )

6)

i. ශ්‍රී ලංකාවේ වාසය කළ මුල් කාලීන මානවයා සිය ආහාර අවශ්‍යතාවය සපුරාගත් ආකාර දෙකක් නම් කරන්න

(ලකුණු 2 යි )

ii. ශ්‍රී ලංකාවේ වාසය ආදී මිනිසා ආහාර ලෙස ලබා ගත් සත්ත්ව ආහාර වර්ග දෙකක් හා ශාක ආහාර වර්ග දෙකක් නම් කරන්න. ( ලකුණු 4 යි )

iii. විජය කුමරු මෙරටට පැමිනෙන අවධිය වන විට ශ්‍රී ලංකාවේ වාසය කළ මානවයින් ගේ ජීවන රටාව පිළිබඳ තොරතුරු කෙටියෙන් ලියා දක්වන්න. ( ලකුණු 6 යි )

7)

i.a අනුරාධපුර නගරය නිර්මාණය කළ රජු කවුරුන්ද?

b අනුරාධපුරයේ පිහිටි ථූපාරාමයට වටදා ගෙයක් නිර්මාණය කළ රජු කවුරුන් ද ? ( ලකුණු 2 යි )

ii. පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරයේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කළ ආකාරය පිළිබඳ කරුණු දෙකක් ලියා දක්වන්න ( ලකුණු 4 යි )

iii.දේවානම්පිය තිස්ස රජු බුදුදහම වෙනුවෙන් සිදුකළ සේවාවන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 6 යි )